සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

14471

10 ශ්‍රේණිය

දෙවන වාර පරීක්ෂණය - 2024

32	S	I

නම: ....

ගණිතය

කාලය පැය දෙකයි

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- A කොටසේ සියලු ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 02 බැගින් ද B කොටසෙහි එක් ප්‍රශ්නයක නිවැරදි පිළිතුරු සඳහා ලකුණු 10 බැගින් ද හිමිවේ.

A - කොටස

01. තක්සේරු වටිනාකම රුපියල් 75 000 ක් වූ ගොඩනැගිල්ලක් සඳහා 8% ක වාර්ෂික වරිපනම් බද්දක් අයකරයි. එම ගොඩනැගිල්ල සඳහා වසරකට ගෙවිය යුතු වරිපනම් බදු මුදල සොයන්න.

02. විසඳන්න. $\frac{6}{x} - 1 = 2$

03. AB චාප දිග 22 cm නම් මෙම කේන්ද්‍රික ඛණ්ඩයේ අරය සොයන්න.



04. x හි අගය සොයන්න.



05. රූපයේ අඳුරු කර ඇති ප්‍රදේශය කුලක අංකනයෙන් ලියන්න.



06. නිවසක මාසයක පාවිච්චි කළ ජල ඒකක ගණන සඳහා මිල රුපියල් 800 කි. ඒ සඳහා 18% ක එකතු කළ අගය මත බද්දක් (VAT) අය කරයි, නම් බද්ද සමග එම නිවසේ එම මාසයේ ජල බිල්පතෙහි වටිනාකම සොයන්න.

07. ABCD සෘජුකෝණාස්‍රාකාර ආස්තරයකින් පරිධිය 44 cm ක් වූ වෘත්තයකින් හරි අඩකට සමාන AED කේන්ද්‍රික ඛණ්ඩය කපා ඉවත් කර ඇත. අඳුරුකළ කොටසේ පරිමිතිය සොයන්න.



08. හිස්තැන් සම්පූර්ණ කරන්න.

ත්‍රිකෝණයක පාදයක් දික් කිරීමෙන් සෑදෙන .... කෝණය එහි.. සම්මුඛ කෝණ දෙකෙහි එකතුවට සමාන වේ.

09. සුළු කරන්න. $\dfrac{1}{2x} + \dfrac{1}{4x}$

10. රූපයේ දී ඇති තොරතුරු ඇසුරින්



(i) x හි අගය සොයන්න.

(ii) y හි අගය සොයන්න.

11. සිසුන් 9 දෙනෙක් ඇගයීමකට ලබාගත් ලකුණු පහත දැක්වේ.
4, 3, 2, 3, 4, 1, 5, 3, 2
මෙහි මධ්‍යස්ථ ලකුණ සොයන්න.

12. මෙම වීජීය පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න. $2ab^2$, $6a^2b$

13. $3.4 \times 3.4 = 11.56$ $3.5 \times 3.5 =$ ....
හිස්තැන සම්පූර්ණ කර $\sqrt{12}$ හි අගය පළමු සන්නිකර්ෂණය ට සොයන්න.

14. ABCD සමාන්තරාස්‍රාකාර ආස්තරයේ ABD ත්‍රිකෝණාකාර කොටසේ වර්ගඵලය 25cm^2 කි. AB සහ DC පාද අතර ලම්බ උස 5 cm නම් DC පාදයේ දිග සොයන්න.



15. සාධක සොයන්න. $x^2 + x - 30$

16. රූපයේ තොරතුරු ඇසුරින් x හා y හි අගය සොයන්න.



17. සංඛ්‍යා රේඛාවේ දැක්වෙන අසමානතාව ලියන්න.



18. රූපයේ දී ඇති තොරතුරු ඇසුරින්

(i) $A\hat{B}C$ හි අගය සොයන්න.

(ii) $D\hat{A}B$ හි අගය සොයන්න.



19. සුළු කරන්න. $1\frac{1}{2}$ න් $\left(\frac{1}{6}+\frac{1}{3}\right)$

20. ඒකාකාර හරස්කඩක් සහිත නලයකින්, 2000 l ක ධාරිතාවයකින් යුත් ටැංකියකින් $\frac{1}{4}$ ක් පිරීමට මිනිත්තු 10 ක් ගතවේ. නලයෙහි ජලය ගලා යාමේ සීඝ්‍රතාව ගණනය කරන්න.

21. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශ තෝරා ඉදිරියෙහි ඇති කොටු තුළ "✓ "ලකුණ යොදන්න.

a. ත්‍රිකෝණයක කෝණ දෙකක් සමාන නම් සමාන කෝණවලට සම්මුඛ පාද සමාන වේ. ☐

b. සමාන්තරාස්‍රයක විකර්ණ මගින් එහි වර්ගඵලය සමච්ඡේදනය වේ. ☐

c. සමාන්තරාස්‍රයක සම්මුඛ කෝණ පරිපූරක වේ. ☐

22. දී ඇති ප්‍රස්තාරයෙහි අනුක්‍රමණය 2 වේ.
එහි සමීකරණය ලියන්න.



23. ABC සහ PQR ත්‍රිකෝණ යුගල අංගසම වන අවස්ථාව ලියන්න.



24. බෑගයක හැඩයෙන් හා තරමින් සමාන රතුපාට පබළු දෙකක් සහ නිල් පාට පබළුවක් ඇත. අහඹු ලෙස බෑගයෙන් ඉවතට ගත් පබළුවක් රතුපාට එකක් වීමේ සම්භාවිතාව සොයන්න.

25. A, B, C යනු සමතලා බිමක පිහිටි ස්ථාන 3 කි. AB හා BC ට සමදුරින් ද B සිට 5 m ක් දුරින් ද පිහිටි P ලක්ෂ්‍යය, පථ පිළිබඳ දැනුම භාවිතයෙන් නිර්මාණ රේඛා දක්වමින්, රූපය මත ලකුණු කරන්න.



CamScanner

B කොටස

- ප්‍රශ්න සියල්ලටම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

(01) සම්පත් මහතා තම කුකුළු ගොවිපළෙන් පසුගිය මාසයේ ලබාගත් ආදායමෙන් $\frac{1}{8}$ ක් නිවසේ ආහාර සඳහා ද, එමෙන් 4 ගුණයක් සතුන්ගේ ආහාර සඳහාද, ඉතිරියෙන් $\frac{2}{3}$ ක් වෙනත් වියදම් සඳහාද, තබාගෙන ඉතිරිය බැංකු ගිණුමේ තැන්පත් කරන ලදි.

i. සතුන්ගේ ආහාර සඳහා තබාගත් මුදල මුළු ආදායමෙන් කුමන භාගයක් ද?

ii. වෙනත් වියදම් සඳහා තබාගත් මුදල මුළු ආදායමෙන් භාගයක් ලෙස දක්වන්න.

iii. වෙනත් වියදම් සඳහා තබාගත් මුදල රුපියල් 40 000 ක් නම් පසුගිය මාසයේ ඔහු කුකුළු ගොවිපළෙන් ලැබූ මුළු ආදායම සොයන්න.

iv. සත්ව ආහාර මිළ ඉහළ යෑම නිසා ඉහත සත්ව ආහාර සඳහා වෙන්කළ මුදලට අමතරව වෙනත් වියදම් සඳහා වෙන්කළ මුදලින් රුපියල් 15 000 ක් ද ඒ සඳහා වැය විය. එලෙස සත්ව ආහාර සඳහා වැය වූ මුළු මුදල සොයන්න.

(02) තුනී ලෝහ තහඩුවකින් සකස් කරන ලද ලාංඡනයක් රූපයේ දැක්වේ. එහි ABCD සමාන්තරාස්‍රාකාර කොටසකි. එහි AB පාදය මත AEF කේන්ද්‍රික ඛණ්ඩ කොටසක් ද , BEF සමද්විපාද සෘජුකෝණික ත්‍රිකෝණාකාර කොටසක් ද ඇත.
EG = 10 cm ක් ද ABCD කොටසේ වර්ගඵලය $280\ cm^2$ ක් ද වේ.



i. AB පාදයේ දිග සොයා කේන්ද්‍රික ඛණ්ඩයේ අරය ලියන්න.

ii. කේන්ද්‍රික ඛණ්ඩයේ චාප දිග ගණනය කරන්න.

iii. ත්‍රිකෝණාකාර කොටසේ වර්ගඵලය සොයන්න.

iv. කේන්ද්‍රික ඛණ්ඩ කොටසේ වර්ගඵලය ත්‍රිකෝණාකාර කොටසේ වර්ගඵලයට වඩා කොපමණ වැඩිදැයි සොයන්න.

CamScanner

14172

(03) පාසලක බිත්තිවල තීන්ත ආලේප කිරීම සඳහා මිනිසුන් 10 දෙනෙකුට දින 9 ක් ගතවේ. පළමු දින තුනෙහි මේ සඳහා මිනිසුන් 12 දෙනෙකු ද ඊළඟ දින දෙකෙහි මිනිසුන් 14 දෙනෙකු ද එම කාර්යය සඳහා සහභාගී විය.

i. පාසලේ තීන්ත ආලේප කිරීමේ කාර්යය සඳහා ගතවන මිනිස් දින ගණන සොයන්න.

ii. පළමු දින තුන අවසානයේ ඉතිරිවන කාර්යය ප්‍රමාණය මිනිස් දින කීයද ?

iii. දින 5 ක දී නිමකර ඇති කාර්යය ප්‍රමාණය මිනිස් දින කොපමණද ?

iv. දින 7 කින් මෙම කාර්යය නිම කිරීමට අවසන් දින දෙකේ දී යෙදවිය යුතු මිනිසුන් ගණන සොයන්න.

(04) පාසලක 10 ශ්‍රේණියේ සිසුන් පළමු වාර විභාගයේ දී ගණිතය විෂයට ලබාගත් ලකුණු දැක්වෙන අසම්පූර්ණ වගුවක් සහ වට ප්‍රස්තාරයක් පහත දැක්වේ.

ලකුණු පරාසය	ශිෂ්‍ය සංඛ්‍යාව
0- 34	....
35 - 49	10
50 - 64	12
65 - 74	6
75 - 100	....



i. මෙම ශ්‍රේණියේ සිසුන් ගණන සොයන්න.

ii. 50-64 ලකුණු පරාසයේ සිසුන් දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ කේන්ද්‍රික කෝණයේ විශාලත්වය සොයන්න.

iii. P ලෙස නම් කරන ලද කේන්ද්‍රික ඛණ්ඩයට අයත් ලකුණු පරාසය කුමක් ද?

iv. 0-34 ලකුණු පරාසයේ ශිෂ්‍ය සංඛ්‍යාව 75-100 ලකුණු පරාසයේ ශිෂ්‍ය සංඛ්‍යාව මෙන් දෙගුණයක් නම් වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

v. දෙවන පාසල් වාරයේ දී මෙම ශ්‍රේණියට සිසුන් 5 දෙනෙකු අලුතින් ඇතුළත් වූ අතර ඔවුන් සියලු දෙනාම ගණිතය විෂයට ලකුණු 75 ට වඩා ලබාගෙන ඇත. ඒ අනුව පළමු වාරයේ ගණිතය විෂයය ලකුණු වලට අදාළව සකස් කරන ලද නව වට ප්‍රස්තාරයේ ලකුණු 75-100 පරාසයේ කේන්ද්‍රික කෝණයේ විශාලත්වය සොයන්න.

(05) භාජනයක එකම ප්‍රමාණයේ රතු පාට පෑන් 2 ක් ද කොළ පාට පෑන් 3 ක් ද නිල් පාට පෑන් 4 ක් ද ඇත. අවන්ති අහඹු ලෙස ඉන් පෑනක් ඉවතට ගනියි.

i. ඇයට ලැබිය හැකි සියලු ප්‍රතිඵල ඇතුළත් නියැදි අවකාශය ලියන්න.

ii. ඇයට කොළ පාට පෑනක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

iii. ඇය ගත් පෑන නිල්පාට පෑනක් නොවීමේ සම්භාවිතාව සොයන්න.

iv. ඇයට කොළපාට හෝ නිල් පාට හෝ පෑනක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

v. අවන්තිට ලැබුණු පෑන රතු පාට පෑනක් බව ඇය පවසා එය ඇය තබාගන්නා ලදි. ඉන් පසුව නිමන්ති ද අහඹු ලෙස පෑනක් ගනියි. ඇයට නිල්පාට පෑනක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 32 S II

ගණිතය II

කාලය පැය තුනයි

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි. අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න තීරණය කිරීමටත් යොදාගන්න.

- A කොටසින් ප්‍රශ්න 5 ක් ද B කොටසින් ප්‍රශ්න 5 ක් ද තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී අදාළ පියවර හා නිවැරදි ඒකක ලියා දක්වන්න.
- සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර සඳහා ලකුණු 10 බැගින් හිමිවේ.

A - කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) i. මූල්‍ය ආයතනයකින් 12% ක වාර්ෂික සුළු පොලී අනුපාතිකයක් යටතේ යම් මුදලක් ණයට ගත් පුද්ගලයෙකුට අවුරුදු තුනක් අවසානයේ පොලිය ලෙස රුපියල් 54 000 ක් ගෙවීමට සිදුවේ. ඔහු ණයට ගත් මුදල සොයන්න.

ii. ඔහු ලබාගත් ණය මුදලින් හරි අඩක් නිවස අලුත්වැඩියා කිරීම සඳහා වැයකර එම නිවස මසකට රුපියල් 10 000 බැගින් කුලියට දී වර්ෂයක කුලී මුදල එකවර ලබාගෙන එම මුදලත්, ණය මුදලේ ඉතිරි කොටසත් එකතු කර 10% වාර්ෂික සුළු පොලියට වෙනත් මූල්‍ය ආයතනයක තැන්පත් කරයි. වසර 3 කට පසු එම තැන්පතුවෙන් ඔහුට ලැබෙන පොලිය, ණය මුදල සඳහා ගෙවිය යුතු පොලියට වඩා වැඩි බව පෙන්වන්න.

(02) a. $y = x^2 - 3$ ශ්‍රිතයෙහි ප්‍රස්තාරය ඇඳීම සඳහා සකස් කළ අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

x	-3	-2	-1	0	1	2	3
y	6	1	-2	.....	-2	1	6

i. $x = 0$ වන විට y හි අගය සොයන්න.

ii. x හා y අක්ෂ දිගේ කුඩා කොටු 10 කින් ඒකක එකක් නිරූපණය වනසේ ඉහත ප්‍රස්තාරය අඳින්න.

b. ඔබ ඇඳි ප්‍රස්තාරය භාවිතයෙන්,

i. ප්‍රස්තාරයෙහි සමමිති අක්ෂයේ සමීකරණය ලියන්න.

ii. ශ්‍රිතය සෘණවන x හි අගය ප්‍රාන්තරය ලියන්න.

iii. ඉහත ප්‍රස්තාරය y අක්ෂය ඔස්සේ ඒකක 2 ක් ඉහළට චලනය කිරීමෙන් ලැබෙන ප්‍රස්තාරයේ හැරුම් ලක්ෂ්‍යයේ ඛණ්ඩාංකය ලියන්න.

(03) දොඩම් ගෙඩි 10 ක් මිලදී ගන්නා මුදලින් ඇපල් ගෙඩි 6 ක් මිලදී ගත හැක. දොඩම් ගෙඩි 2 ක් හා ඇපල් ගෙඩි 3 ක් මිලදී ගැනීමට රුපියල් 420 ක් වැයවේ.

i. දොඩම් ගෙඩියක මිල රුපියල් x ද ඇපල් ගෙඩියක මිල රුපියල් y ද ලෙස ගෙන සමගාමී සමීකරණ යුගලක් ගොඩනගන්න.

ii. එම සමගාමී සමීකරණ යුගල විසඳීමෙන් දොඩම් ගෙඩියක හා ඇපල් ගෙඩියක මිල වෙන වෙනම සොයන්න.

iii. රුපියල් 500 කට දොඩම් හා ඇපල් ගෙඩි සමාන ප්‍රමාණවලින් මිලදී ගත්විට රුපියල් 20 ක් ඉතිරි වේ නම් මිලදී ගතහැකි දොඩම් ගෙඩි ගණන සොයන්න.

(04) (a) හා (b) යනු අරය r වූ කේන්ද්‍රික ඛණ්ඩ දෙකකි. මේවායේ වර්ගඵල අතර වෙනස $\pi(r+3)\ cm^2$ වේ. r මගින් $r^2 - 4r - 12 = 0$ වර්ගජ සමීකරණය සපුරාලන බව පෙන්වා එය විසඳීමෙන් $r < 7cm$ බව පෙන්වන්න.



(a)



(b)

(05) සහල් වෙළඳසැලක දින 30 ක දී විකුණන ලද සහල් ප්‍රමාණ පහත වගුවේ දැක්වේ.

දිනකදී විකුණන ලද සහල් ප්‍රමාණය (kg)	6	7	8	9	10	11	12
දින ගණන	2	3	6	10	5	3	1

i. වැඩිම දින ගණනක දී විකුණන ලද සහල් කිලෝග්‍රෑම් ගණන ලියන්න.

ii. දිනකදී විකුණන ලද මධ්‍යන්‍යය සහල් ප්‍රමාණය ආසන්න කිලෝග්‍රෑමයට සොයන්න.

iii. වෙළඳසැලේ ගබඩාකාර ඇති සහල් 1000 kg ක් මාස තුනකට ප්‍රමාණවත් බව වෙළඳසැල් හිමිකරු පවසයි. දිනකට විකුණන ලද මධ්‍යන්‍යය සහල් ප්‍රමාණය සැලකීමෙන් වෙළඳසැල් හිමිකරුගේ ප්‍රකාශය සත්‍යය හෝ අසත්‍යය බව හේතු සහිතව පෙන්වන්න.

(06) A,B, C යනු තිරස් පොළොව මත පිහිටි ස්ථාන තුනකි.

A ට හරි උතුරින් 50 m ක් දුරින් B පිහිටා ඇත. A සිට C හි දිගංශය 050° ක් වන අතර A ~~සිට 40 m ක් දුරින් C පිහිටා ඇත~~. B සිට C හි දිගංශය 140° කි.



i. රූපය ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන ඉහත තොරතුරු එහි ඇතුළත් කරන්න.

ii. $B\hat{C}A$ හි අගය සොයන්න.

iii. C සිට A හි දිගංශය සොයන්න.

iv. 1:1000 පරිමාණයට ඉහත රූපයේ පරිමාණ රූපය අඳින්න.

v. පරිමාණ රූපය ඇසුරෙන් BC සැබෑ දිග සොයන්න.

CamScanner

B- කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(07) සාධාරණ පදය $T_n = 25 - 4n$ වන සංඛ්‍යා අනුක්‍රමයක,

i. මුල් පද දෙක ලියන්න.

ii. පොදු අන්තරය සොයන්න.

iii. 6 වන පදය සොයන්න.

iv. -35 යනු සංඛ්‍යා අනුක්‍රමයේ කී වෙනි පදය ද?

v. -20 මෙම සංඛ්‍යා අනුක්‍රමයේ පදයක් නොවන බව පෙන්වන්න.

(08) සරල දාරයක්, mm/cm පරිමාණයක්, කවකටුවක් භාවිත කර නිර්මාණ රේඛා පැහැදිලිව දක්වමින් පහත නිර්මාණය කරන්න.

i. $AB = 7$ cm සරල රේඛා ඛණ්ඩය නිර්මාණය කර A හි දී AB ට ලම්බය නිර්මාණය කරන්න.

ii. $A\hat{B}C = 45^0$ කෝණය නිර්මාණය කර ABC ත්‍රිකෝණය සම්පූර්ණ කරන්න.

iii. BC හි ලම්බ සමච්ඡේදකය නිර්මාණය කර එය BC ඡේදනය වන ලක්ෂ්‍යය O ලෙස නම් කරන්න.

iv. $A\hat{B}C$ කෝණ සමච්ඡේදකය නිර්මාණය කර එය ඉහත ලම්බ සමච්ඡේදකය ඡේදනය වන ලක්ෂ්‍යය P ලෙස නම් කරන්න.

v. P කේන්ද්‍රය වූ ද අරය OP වූ ද වෘත්තය නිර්මාණය කර OP දිග මැන ලියන්න.

(09) (a) පතුලේ වර්ගඵලය $150cm^2$ වන ඝනකාභ හැඩැති භාජනයක 12cm උසට ජලය පුරවා ඇත. පැත්තක දිග සෙන්ටිමීටර a වන ඝන ලෝහ ඝනක 6 ක් සම්පූර්ණයෙන්ම ජලයේ ගිලී යන ලෙස භාජනයට දැමූ විට එහි ජල කඳ 17cm තෙක් ඉහළ යයි. ලෝහ ඝනකයක පැත්තක දිග සොයන්න.





(b) ලඝු ගණක වගු භාවිතයෙන් අගය සොයන්න.

$$\frac{94.28 \times 5.2}{234.1}$$

(10) ABC සමද්විපාද Δ යේ $AC=BC$ වේ. BC පාදය D තෙක් දික්කර ඇත.
$A\hat{B}C$ හි කෝණ සමච්ඡේදකය BE ද $BA /\!/ CF$ ද වේ.

(i) $A\hat{C}F = 2A\hat{B}E$ බව පෙන්වන්න.

(ii) $A\hat{C}F = 60^0$ ද $AC = 8\ cm$ ද නම් හේතු දක්වමින් AB දිග සොයන්න.



(11) ABC Δ යේ BC පාදයේ මධ්‍ය ලක්ෂ්‍යය D වේ.
AD පාදය E තෙක් දික්කර ඇත. B සිට AD ට හා C සිට දික්කළ AD ට අඳින ලද ලම්බ පිළිවෙලින් BP හා CQ වේ.

(i) $D\hat{A}C = 30^0$ ද $A\hat{C}D = 40^0$ ද නම් $D\hat{C}Q$ අගය සොයන්න.

(ii) BPD $\Delta \equiv$ CQD Δ බව පෙන්වන්න.

(iii) BQCP සමාන්තරාස්‍රයක් බව පෙන්වන්න.



(12) කුඩා පාසලක 6 - 11 ශ්‍රේණිවල මුළු ළමයි ගණන 60 කි. ඉන් 40 දෙනෙකු ගැහැණු ළමුන් ය. නැටුම් විෂයය හදාරන ගැහැණු ළමුන් ගණන 25 කි. නැටුම් විෂයය හදාරන්නේ නැති ළමුන් ගණන 27 කි.



(i) දී ඇති වෙන් රූපය ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන ඉහත තොරතුරු එහි ඇතුළත් කරන්න.

(ii) නැටුම් විෂයය හදාරන පිරිමි ළමුන් ගණන සොයන්න.

(iii) පාසලේ සියලුම ගැහැණු ළමුන් නැටුම් විෂයය තෝරා ගන්නේ නම් එම තොරතුරු දැක්වීමට වෙන් රූපයක් ඇඳ එම දත්ත එහි ඇතුළත් කරන්න.

* * * *

PARCEL NO

LOL.lk BookStore

විභාග ඉලක්ක

පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න

කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න